අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019

**General Certificate of Education (Advance Level) Examination - 2019**

| | | | |
|---|---|---|---|
| සාමාන්‍ය පොදු පරීක්ෂණය<br>பொதுச் சாதாரணப் பரீட்சை<br>Common General Test | **12** | **S** | පැය දෙකයි<br>*Two Hours* |

- සාමාන්‍ය දැනීම කාලීන ලෝක දැනුම සහිත ප්‍රශ්න **30** කි.
- ප්‍රශ්න **සියල්ලටම** පිලිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි වරණය තෝරා යටින් ( _ ) ඉරක් අඳින්න.
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

**1.** 2019 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය පැවැත්වූ රට කුමක් ද?
(1) නවසීලන්තය (2) එංගලන්තය (3) බංග්ලාදේශය (4) පකිස්ථානය (5) ඉන්දියාව

**2.** 2019 අප්‍රේල් මස 21 වන දින එල්ල වූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් (Easter Sunday Terrorist Attack) පසු මෙරට සංචාරය කල පලමු විදේශ රාජ්‍යය නායකයා මින් කවුරුන් ද?
(1) පකිස්ථාන අගමැති ඉම්රාන් ඛාන්
(2) මාලදිවයින් ජනාධිපති ඉබ්‍රාහිම් මොහොමඩ් සෝලේ
(3) නවසීලන්ත අගමැතිනි ජෙසින්ඩා ආර්ඩන්
(4) ඉන්දියාවේ අගමැති නරේන්ද්‍ර සිං මෝදි
(5) බංග්ලාදේශ අගමැතිනි ෂීක් හසීනා

**3.** ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය අනුව නියමිත කාලයට පෙර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවාලිය හැක්කේ වසර කීයකට පසුව ද?
(1) වසර තුනකට පසු
(2) වසර තුනයි මාස හයකට පසු
(3) වසර හතරකට පසු
(4) වසර හතරයි මාස හයකට පසු
(5) වසර පහකට පසු

**4.** "උග්‍ර ආර්ථික අර්බුදයකින් පෙලෙන දකුණු ඇමෙරිකානු රටක සමාජවාදී පාලනය බිඳ දැමීමට ඇමෙරිකාවේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් හට දැඩි වුවමනාවක් තිබෙන ආකාරයක් ජාත්‍යන්තර දේශපාලන ලෝකය තුල පසුගිය කාලයේ දැක ගන්නට ලැබු අතර ඔහු එරට විපක්ෂ නායකවරයාව එරට ජනාධිපතිවරයා ලෙස නිල වශයෙන් පිලිගන්නා ලදී." මෙම සිදුවීමට අදාල රට කුමක් ද?
[දෙවෙනි පිටුව බලන්න.
(1) කියුබාව (2) ආර්ජන්ටිනාව (3) වෙනිසියුලාව (4) බ්‍රසීලය (5) මෙක්සිකෝව

**5.** 2018 වසරේදී රුසියාවේ පැවති පාපන්දු ලෝක කුසලාන තරඟාවලිය (FIFA) ජයග්‍රහණය කලේ මින් කුමන රට ද?
(1) ක්‍රොඒෂියාව (2) බෙල්ජියම (3) රුසියාව (4) ප්‍රංශය (5) බ්‍රසීලය

**6.** ලොව විශාලතම මහ මැතිවරණය පවත්වන රට වන ඉන්දියාව 2019 වසරේදී සිය නැවත වරක් සිය නව අග්‍රාමාත්‍යවරයා ලෙස නරේන්ද්‍ර සිං මෝදි මහතා තෝරා පත් කර ගන්නා ලදී. ඔහු එරට මහ මැතිවරණය ජයග්‍රහණය කලේ මින් කවර පක්ෂයක් නියෝජනය කරමින් ද?
(1) ඉන්දියානු කොංග්‍රස් පක්ෂය
(2) ද්‍රවිඩ මුන්නේත්‍රම් කසාගම් පක්ෂය
(3) ඉන්දියානු සමාජවාදී පක්ෂය
(4) භාරතීය ජනතා පක්ෂය
(5) ශිව සේනා පක්ෂය

**7.** කාන්තාවන් සඳහා දැඩිව පැවති නීති ලිහිල් කරමින්, කාන්තා නිදහස ලබා දීමට කටයුතු කරමින් සිටින මැදපෙරදිග රාජ්‍යය මින් කුමක් ද?
(1) ලිබියාව (2) ඕමානය (3) ජෝර්දානය (4) කටාර් රාජ්‍යය (5) සෞදි අරාබිය

**8.** පෙර පැවති නජීබ් රසාක් පාලනය විසින් සිදු කල දූෂණ ක්‍රියාවලට එරෙහිව දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට පොරොන්දු දෙමින් හා තම උප අග්‍රාමාත්‍යවරයා වන අන්වර් ඉබ්‍රාහීම්ට වසර දෙකකින් බලය පවරන බවට ප්‍රතිඥා දෙමින් 2018 දී බලයට පත් වූ "මහතීර් මොහොමඩ්" මින් කුමන අග්නිදිග ආසියාතික රටක අග්‍රාමාත්‍යවරයා ද?
(1) තායිලන්තය (2) මැලේසියාව (3) ඉන්දුනීසියාව (4) පිලිපීනය (5) වියට්නාමය

**9.** හෙළයේ මහා ගාන්ධාර්වයා ලෙස විරුදාවලිය ලත් "ඩබ්ලිව්.ඩී. අමරදේව" මහතා පිලිබඳ **අසත්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?

(1) ඔහුගේ මුල් නම වන්නේ වන්නකුවත්ත වඩුගේ දොන් ඇල්බට් පෙරේරා ය.

(2) ඔහු 1972 දී බ්‍රිතාන්‍ය එළිසබෙත් රැජිනගේ ආරාධනයෙන් "ගවුමි සලාම්" නම් වූ මාලදිවයින් ජාතික ගීතයේ තනුව නිර්මාණය කලේ ය.

(3) ඔහු උපත ලබන්නේ 1927 දී මොරටුවේදී ය.

(4) ඔහු පිලිපීනය විසින් පිරිනමන රැමෝන් මැග්සයිසේ සම්මානයෙන් පිදුම් ලැබුවේ 2010 වසරේදී ය.

(5) ඔහු රන් මුතු දූව, ගම්පෙරළිය, ගැටවරයෝ, තුන්මං හංදිය චිත්‍රපට වල සංගීත අධ්‍යක්ෂකවරයා ය.

**10.** පහත සඳහන් ලෝක පූජිත පුද්ගලයන් හා ඔවුන් නිරත වූ ක්ෂේත්‍ර පිලිවෙලින් **නොගැලපෙන** වරණය මින් කුමක් ද?

(1) නෙල්සන් මැන්ඩෙලා - දේශපාලන ක්ෂේත්‍රය
(2) ටයිගර් වුඩ්ස් - ක්‍රීඩා ක්ෂේත්‍රය
(3) රවින්ද්‍රනාත් තාගෝර් - සාහිත්‍ය ක්ෂේත්‍රය
(4) චාලි චැප්ලින් - සිනමා ක්ෂේත්‍රය
(5) බෙනාසීර් භුතෝ - වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රය

**11.** ශ්‍රී ලංකා රජය විසින් මෑත කාලීනව ලෝක වෙලඳපොලේ මිල උච්චාවචන වලට සමපාතව මෙරටද මිල උච්චාවචන පාලනය කිරීම සඳහා මිල සූත්‍රයක් (Price Formula) හඳුන්වා දුන්නේ මින් කවරක් සඳහා ද?

(1) පොහොර (2) දැව හා ලී බඩු (3) ඛනිජ තෙල් (4) ජංගම දුරකථන (5) ආනයනික පලතුරු

**12.** ලෝකයේ මුස්ලිම් ප්‍රජාවට පමණක් සුවිශේෂී වන නීති ක්‍රමය මින් කුමක් ද?

(1) තේසවලාමෙයි (2) රෝම - ලන්දේසි (3) ශරියා (4) කැනොන් (5) අද්මිරාල්

**13.** ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දැනට එක්කර ඇති සංශෝධන ගණන කීය ද?

(1) 13 කි. (2) 17 කි. (3) 18 කි. (4) 19 කි. (5) 20 කි.

**14.** මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිවරයා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සඳහා මරණ දඬුවම පසුගියදා ක්‍රියාත්මක කලේය. එසේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සඳහා දැඩි නීති මෙන්ම මරණ දඬුවම ක්‍රියාත්මක කල "රොඩ්රිගෝ ඩියුටර්ට්" (Rodrigo Duterte) මින් කුමන අග්නිදිග ආසියාතික රටේ රාජ්‍ය නායකයා ද?

(1) තායිලන්තය (2) මැලේසියාව (3) ඉන්දුනීසියාව (4) පිලිපීනය (5) මියන්මාරය

**15.** ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2015 වර්ෂයේදී සිදු කරන ලද 19 වන සංශෝධනය අනුව රාජ්‍ය සේවයේ සිදු කරනු ලබන පත්වීම් සඳහා ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම සඳහා පිහිටුවන ලද "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ" සභාපතිත්වය හිමිවන්නේ මින් කවරකු හට ද ?

(1) අග්‍රාමාත්‍යවරයාට ය.
(2) සභානායකවරයාට ය.
(3) කථානායකවරයාට ය.
(4) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයාට ය.
(5) විපක්ෂ නායකවරයාට ය.

**16.** මෙක්සිකානු දේශසීමාවේ ආරක්ෂිත තාප්පයක් ඉදිකිරීම සඳහා එරට ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කල මුදල් ප්‍රතිපාදන ඇස්තමේන්තු එරට ව්‍යවස්ථාදායකය විසින් සම්මත නොකිරීමත්, ඊට එරෙහිව ව්‍යවස්ථාදායකය සම්මත කරන කිසිදු පනත් කෙටුම්පතකට ජනාධිපතිවරයා අත්සන් නොතැබීමත් හේතු කොට ගෙන 2019 දී දැඩි ව්‍යවස්ථාදායක හා විධායක සට්ටනය නිසා එරට මධ්‍යම රජය අක්‍රිය තත්වයක පැවති රට මින් කුමක් ද?

(1) කැනඩාව (2) ඇලස්කාව (3) මෙක්සිකෝව (4) කියුබාව (5) ඇමෙරිකාව

**17.** 2019 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලියේ අවසන් තරඟාවලියට සුදුසුකම් ලැබූ රටවල් ද්විත්වය අඩං

[තුන්වැනි පිටුව බලන්න.

(1) පාකිස්ථානය - නවසීලන්තය
(2) ඕස්ට්‍රේලියාව - දකුණු අප්‍රිකාව
(3) නවසීලන්තය - ඕස්ට්‍රේලියාව
(4) එංගලන්තය - නවසීලන්තය
(5) ඉන්දියාව - එංගලන්තය

**18.** ලෝක දේශපාලනයේ ප්‍රබල න්‍යෂ්ඨික බලයක් හිමි රටවල් ද්විත්වයක රාජ්‍ය නායකයන් වන ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් හා උතුරු කොරියානු නායක කිම්-ජෝන්-අන් අතර පලමු ඓතිහාසික හමුව සිදුවූයේ මින් කොහේදී ද?

(1) වියට්නාමයේ හැනෝයි
(2) දකුණු කොරියාවේ සෝල්
(3) ජපානයේ ඔසාකා
(4) ඉන්දුනීසියාවේ ජකර්තා
(5) සිංගප්පූරුවේ සෙන්තෝසා

**19.** ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ, සිවිල් යුද්ධයකට නොයන්නැයි දෙපතුල් සිප ගනිමින් ඉල්ලීමක් සිදු කල වතිකානුවට පැමිණි "ජනාධිපති සල්වා කීර්" කිනම් රටක රාජ්‍ය නායකයා ද?

(1) පලස්තීනය (2) දකුණු අප්‍රිකාව (3) කෙන්යාව (4) දකුණු සුඩානය (5) ඊශ්‍රායලය

**20.** 2018 වසරේ දී නොබෙල් සාම ත්‍යාගය (The Nobel Peace Prize) හිමිකරගත් දෙදෙනා මින් කවුරුන් ද?

(1) රුසියාවේ ව්ලැඩ්මීර් පුටින් - පාකිස්ථානයේ මලාලා යූසෆ්සායි
(2) ඇමෙරිකාවේ ඩොනල්ඩ් ට්‍රම්ප් - උතුරු කොරියාවේ කිම්-ජෝන්-අන්
(3) ස්වීඩනයේ ගියෙටා තුන්බර්ග් - පාකිස්ථානයේ ඉම්රාන් ඛාන්
(4) බංග්ලාදේශයේ බෙගම් කලීඩා ෂියා - ටිබෙටයේ දලයි ලාමා තුමා
(5) ඉරාකයේ නාදියා මුරාද් - කොංගෝවේ ඩෙනිස් මුක්වීජ්

**21.** වැඩිහිටියන් අතර ස්ව කැමැත්තෙන් සිදුවන සමලිංගික සේවනය අපරාධමය වරදක් නොවන බව එක්තරා දකුණු ආසියාතික රටක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඓතිහාසික නඩු තීන්දුවක් ලබා දෙමින් 2018 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශ කලේය. එම රට කුමක් ද?
(1) භූතානය (2) බංග්ලාදේශය (3) ඉන්දියාව (4) නේපාලය (5) මාලදිවයින

**22.** 2019 වසරේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් පළමු වරට ඝනක චන්ද්‍රිකාවක් (cube satellite) නිර්මාණය කර එය කක්ෂගත කිරීමට ලාංකීය අභ්‍යාවකාශ ඉංජිනේරුවන් දෙදෙනෙකු සමත් විය. එම චන්ද්‍රිකාව නම් කර ඇත්තේ මින් කුමන නමකින් ද?
(1) මහසෙන් 1 (2) රාවණා 1 (3) ජයබාහු 1 (4) වසභ 1 (5) ගැමුණු 1

**23.** චීනය මගින් ක්‍රියාත්මක කොට ඇති "තීරයක් සහ මාවතක් ව්‍යාපෘතිය" (Belt and Road Initiative) මගින් සම්බන්ධතාව හා සහයෝගීතාවය පවත්වාගෙන යෑමට අවධානය යොමු කර ඇත්තේ මින් කුමන රටවල් අතර ද?
(1) ඔපෙක් රටවල් අතර
(2) යුරෝපා සංගමයේ රටවල් අතර
(3) නේටෝ රටවල් අතර
(4) සහෙල් කලාපීය රටවල් අතර
(5) යුරේසියානු රටවල් අතර

**24.** 2019 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලියේ ඇෆ්ගනිස්ථාන කණ්ඩායම පන්දුවට පහරදෙමින් සිටි අවස්ථාවේ කඩුල්ල මුවා කිරීමේ වරදක් සම්බන්ධයෙන් සිදුකළ ඉල්ලීමක් තරඟ විනිසුරු අලීම් දාර් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් විනිසුරු තීරණයකට එරෙහිව නුසුදුසු ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමේ චෝදනා මත ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් දඩයක් හා අඩුවම් ලකුණක් නියම කලේ මින් කවර රටක කණ්ඩායම් නායකයාට ද?
(1) බංග්ලාදේශයේ මෂ්රාෆි මොර්ටාසාට
(2) ශ්‍රී ලංකාවේ දිමුත් කරුණාරත්නට
(3) නවසීලන්තයේ කේන් විලියම්සන්ට
(4) ඉන්දියාවේ විරාත් කෝලිට
(5) එංගලන්තයේ ඉයන් මෝගන්ට

**25.** 2018 වසරේ මහ බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය ආසන්න වශයෙන් කොපමණ ද?
(1) 8.7% (2) 4.8% (3) 3.2% (4) 2.9% (5) 7.7%

**26.** 91 වැනි "ඇකඩමි හෙවත් ඔස්කාර් සම්මාන උලෙළ" ලොස් ඇන්ජලීස්හි ඩොල්බි රඟහලේදී 2019 පෙබරවාරි මසදී පැවැත්විණි. එහිදී හොඳම චිත්‍රපටය (Best Picture) ලෙසින් පිදුම් ලැබුවේ කවර චිත්‍රපටය ද?
(1) ග්‍රීන් බුක් (Green Book)
(2) ද ෆේවරිට් (The Favourite)
(3) අ ස්ටාර් ඉස් බෝර්න් (A Star Is Born)
(4) බ්ලැක් පැන්තර් (Black Panther)
(5) ද වයිෆ් (The Wife)

**27.** මාර්ග නීති උල්ලංඝනය හා රියැදුරන්ගේ නොසැලකිලිමත් බව නිසා සිදුවන රථ වාහන සම්බන්ධ වැරදි හතක (7) අවම දඩය රු. 25,000/- ක් ලෙස ප්‍රකාශයට පත් කරමින් ගැසට් නිවේදනයක් ප්‍රවාහන අමාත්‍යාංශය මගින් පසුගියදා නිකුත් කෙරිණි. ඒ අනුව එම වැරදි වලට අයත් **නොවන්නේ** මින් කුමක් ද?
(1) වලංගු රියැදුරු බලපත්‍රයක් සහිතව රිය ධාවනය
(2) රියැදුරු බලපත්‍රයක් නොමැති තැනැත්තන් සේවා නියුක්ත කිරීම
(3) මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතයෙන් අනතුරුව රිය ධාවනය
(4) වලංගු රක්ෂණ ආවරණයක් නොමැතිව රිය ධාවනය
(5) දුම්රිය මාර්ගය තුළට අපරික්ෂාකාරී ආකාරයෙන් මෝටර් වාහන ධාවනය

**28.** 2019 පාකිස්ථාන මහ මැතිවරණයෙන් ජය ලැබූ එරට හිටපු ක්‍රිකට් නායක ඉම්රාන් ඛාන් එම රටට ලෝක කුසලානය ජයග්‍රහණය කර දුන් වර්ෂය කුමක් ද?
(1) 1987 (2) 1990 (3) 1992 (4) 1996 (5) 1999

**29.** බෝ නොවන නිධන්ගත රෝගයක් වන්නේ මේ අතරින් කවර රෝගය ද?
(1) සරම්ප (2) ලාදුරු (3) ඒඩ්ස් (4) දියවැඩියාව (5) මැලේරියාව

**30.** මෙම ලාංඡනයෙන් නියෝජනය වන්නේ කුමන සංවිධානය ද?
(1) ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC)
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN)
(3) යුරෝපා සංගමය (EU)
(4) ලෝක වෙළඳ සංවිධානය (WTO)
(5) කලාපීය සහයෝගිතාවය සඳහාවන දකුණු ආසියානු සංගමය (SAARC)

* * *